**ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාතයංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අග්‍රිම ගිණුමේ ආරම්භක ශේෂය රු.4,923,582 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය වෙනත් ලැබීම් ලෙස සටහන් කර තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු බව. | අදාළ ආකෘති පත්‍රයේ ආරම්භක ශේෂ සටහන් කිරීමට ස්ථානයක් නොමැතිවීම නිසා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ඉදිරියේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර සටහන් අනුව 2019 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.409,446,297 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව එය රු.407,775,615 ක් විය. ඒ අනුව රු.1,670,682 ක වෙනසක් නිරීක්ෂණය විය | මූල්‍ය තත්වය ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු බව. | දේපළ පිරියත හා උපකරණ ශේෂයෙහි වෙනස නිවැරදි කිරීම සඳහා මාරුකිරීම් පත්‍රයක් භාණ්ඩාගාර වෙත මේ වන විටත් ලබා දී ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව ආදායම් නොවන ලැබීම් රු.6,251,763 ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුම අනුව එය රු.7,835,840 ක් විය. ඒ අනුව රු.1,584,077 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව, ආදායම් නොවන ලැබීම් ලෙස ඇති රු.6,251,763 සමන්විත වන්නේ මුදලින් ලැබූ ආදායම් හා ප්‍රදාන වේ. එසේම මේ සියල්ල මුදලින් ලද ඒවා වේ. නමුත් ශේෂ පිරික්සුමේ සඳහන් රු.7,835,840 ක අගය සමන්විත වන්නේ ඉහත මුදලින් ලද ඒවා සහ වැටුප්වලට අදාළ ආදායම් සංකේතවලට අයත්, හරස් සටහන්වලින් ලද රු.5,826,611 ආදායමකිනි. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.249,823,249 ක් වූ අතර ශේෂ පිරික්සුම අනුව එය රු.251,414,216 ක් විය. ඒ අනුව රු.1,590,967 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | සංචාරක අංශය විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේ දී ප්‍රාග්ධන වියදම් යටතේ වන නඩත්තු වැය විෂයන් හා හැකියා වර්ධනයට අදාළ වියදම් ද මීට එකතු කොට ඇත. ඒ අනුව සංචාරක අංශයේ මෙම වියදම වනුයේ රු.162,075,202 ක් හා වනජීවී අංශයේ වියදම රු.87,748,047 ක් වේ. වර්ෂයට අදාළ හරස් සටහන් ගැලපීම්වල එකතුව වනුයේ රු.1,590,967 කි. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.3,916,333 ක් වුවද ශේෂ පිරික්සුම අනුව එය රු.5,530,793 ක් විය. ඒ අනුව රු.1,614,460 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු බව. | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් මුදලින් දරන ලද වියදම රු.3,916,333 කි. ශේෂ පිරික්සුමට අනුව එය රු.5,530,793 කි. ඒ අනුව වෙනසට හේතුව ශේෂ පිරික්සුමේ ඇතුළත් හරස් සටහන් වේ. හරස් සටහන් මගින් දරන ලද වියදම රු.1,614,460 ක් වේ. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අත්තිකාරම් ගෙවීම් රු.7,929,478 වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.10,015,757 ක් විය. ඒ | -එම- | මෙම අගය, වෙනත් අමාත්‍යාංශ මගින් අමාත්‍යාංශයට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ, ණය ශේෂ |

| | | | |
|---|---|---|---|
| | අනුව රු.2,086,279 ක වෙනසක් නිරීක්ෂණය විය. | | නිරවුල් කිරීම සඳහා මාරු පත්‍ර මගින් සිදු කළ හර කිරීම් ය. ඒ අනුව මුදලින් සිදු නොකළ හා මාරු පත්‍ර මගින් කළ ගනුදෙනු එකතුව රු.2,086,279 ක් වන බැවින් මෙම අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොමැත. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු.335,293 වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.6,113,009 ක් විය. ඒ අනුව රු.5,777,716 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අත්තිකාරම් අයකිරීම් මුදල් වන රු.335,293 යනු මුදලින් අයකිරීම් ය. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව තැන්පත් ලැබීම් රු.102,874,564 වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.103,064,932 ක් විය. ඒ අනුව රු.190,368 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු බව. | තැන්පත් ලැබීම්වල වෙනස වන රු.190,368 ක අගය තැන්පත් ගිණුමේ හරස් සටහන් ලැබීම් ය. |
| (උ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව තැන්පත් ගෙවීම් රු.87,945,097 වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.88,082,567 ක් විය. ඒ අනුව රු.137,470 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | තැන්පත් ගිණුමේ හරස් සටහන් මගින් කළ ගෙවීම් වන රු.136,720 ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් නොකිරීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. |
| (ඌ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් රු.211,480,230 වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.220,062,851 ක් විය. ඒ අනුව රු.8,582,621 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | සමස්ත වියදම සහ ශේෂ පිරික්සුමේ වියදම අතර වෙනස සමන්විත වන්නේ වසර අවසානයේ දී කරන ලද මාරු පත්‍ර සහ හරස් සටහන් හේතුවෙන්ය. |
| (ඍ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අවසාන මුදල් ශේෂය රු.843,548 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එය රු.1,381,683 ක් විය. ඒ අනුව රු.538,135 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අවසාන මුදල් ශේෂය රු.1,381,683 ක් වී ඇතත්, එය තුළ මුදල් ශේෂය පමණක් නොව හරස් සටහන්ද ඇතුළත් වී ඇත. නිවැරදි මුදල් ශේෂය වනුයේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන මුදල් ශේෂය වේ. |

## 1.6.4 අග්‍රිම ශේෂය

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු. 4,923,582 ක් වශයෙන් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.5,171,113ක් වශයෙන් දක්වා තිබුණි. | අග්‍රිම ගිණුම නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | 2018 වර්ෂයේ වනජීවී අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැය කිරීම් යටතේ "වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්" ඇතුළත් කිරීම සඳහා ශීර්ෂයක් වෙන්කර නොතිබූ බැවින්, එය වියදම් යටතට ඇතුළත් කර නොතිබූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල්වල ශුද්ධ වෙනස්වීම ලෙස එකතු කර තිබීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. |

## 1.6.5 අග්‍රිම ගැළපුම් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වෙනත් දෙපාර්තමේන්තුවලින් කරන ලද ගෙවීම් රු.174,183,707 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.163,328,584 ක් විය. | අග්‍රිම ගැලපුම් ගිණුම නිවැරදිව පිළියෙල කළ යුතු බව | මෙම වෙනසට හේතුව වර්ෂ අවසානයේ දී මාරු පත්‍ර මගින් කරන ලද ගිණුම් ගැලපීම් සැලකිල්ලට ගෙන තිබීම වේ. |
| (ආ) | වෙනත් දෙපාර්තමේන්තුවලට කරන ලද ගෙවීම් රු.5,239,724 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.5,530,793 ක් විය. | අග්‍රිම ගැලපුම් ගිණුම නිවැරදිව පිළියෙල කළ යුතු බව | අක්මුදල් ගැලපුම් ගිණුම සැකසීමේ දී ආයතන වෙනුවෙන් කරන ලද ගෙවීම් සටහන් කිරීමේ දී අතපසු වීමකින් සංචාරක අංශය විසින් හර මුදල ඇතුළත් කර නොමැත. |
| (ඇ) | අත්තිකාරම් බී ගිණුමේ ගෙවීම් රු.2,086,280 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.11,393,257 ක් විය. | -එම- | අත්තිකාරම් බී ගිණුමේ ගෙවීම් ලෙස දක්වා ඇති රු.2,086,280 යන්න අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා කරන ලද හර කිරීම්ය. විගණනය විසින් පෙන්වා ඇති රු.11,393,257 |

| | | | |
|---|---|---|---|
| | | | යන්න පෙර පැවති අමාත්‍යාංශ දෙක ඒකාබද්ධ වීමේදී ආරම්භක ශේෂය 159 ශීර්ෂයට මාරු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් කරන ලද හර කිරීමකි. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරික්ෂණය<br>අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2003 මාර්තු 28 දිනැති හා අංක MF/TR/1/2003ද රන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වන ජීවී අංශය විසින් චක්‍රලේඛ විධිවිධාන නොසලකා රු.170,000 මාසික කුලියක් හා රියදුරු අතිකාල ඇතුලත්ව වාහන 03 ක් කුලියට ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.3,207,929 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව රියදුරු රහිතව ගෙවිය යුතු උපරිම ගාස්තු රු.40,000ක් විය යුතු බව. | සයිටීස් ලේකම් කාර්යාලයේ රාජකාරි සඳහා වාහන කුලියට ගැනීමට බුද්ධ ශාසන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා තිබුණි. කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන සඳහා විශාල මුදලක් වැය වන බැවින් ගිවිසුම අත්හිටුවා ඇත. සංචාරක සංවර්ධන වනජීවි හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සතු වාහන සයිටීස් රාජකාරී කටයුතු සඳහා ප්‍රමුඛතා පදනමින් රියදුරු සහිතව අනුයුක්ත කරන ලදී. |

2. **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

2.1 **වියදම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මූලධන වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු රු.75,500,000 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. | රාජ්‍ය අමාත්‍යවරුන් වරින් වර මාරු වීම, ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ අවශ්‍යතාවක් පැන නොගැනීම, මන්නාරම මඩු ප්‍රදේශයේ අඩු වියදම් නිවාස ප්‍රමාණය 144 දක්වා අඩු කිරීම සහ ලෝක බැංකු ණය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ සංචාරක සංවර්ධන වැඩසටහන කල් දැමීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ආ) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් අහුරා තැබීම් අඩු කල පසු එකතුව රු.180,933,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.56,705,638 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදනයෙන් රු.124,227,362 ක් ඉතිරි වී තිබුණි. මෙය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 53 ක සිට සියයට 89 ක් අතර පරාසයක් ගෙන තිබුණි. | - එම- | රාජ්‍ය අමාත්‍යවරුන් වරින් වර මාරුවීම, වත්කම් මිලදී ගැනීම සඳහා අමාත්‍යවරයාගෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම, පැරණි බලකොටු 06 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 190 ක අයවැය ප්‍රතිපාදනයක් ලබා දුන්නද එයින් රු.මිලියන 90 ක් භාණ්ඩාගාරයේ දැනුම් දීම මත අහුරා තැබීම සහ දුම්රිය ස්ථාන වැඩි දියුණු කොට පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීම වෙනුවෙන් රු.මිලියන 50 ක ප්‍රතිපාදන වෙනුවෙන් රු.මිලියන 49.2 ක බැඳීම් ඇති කරගන්නා ලද නමුත් ගිණුම්ගත කොට තිබුණේ රු.මිලියන 8.7 ක් වීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

| | | |
|---|---|---|
| (ඇ) මූලධන වැය විෂයක අහුරා තැබීම් සැලකිල්ලට ගැනීමෙන් පසු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.126,000,000 ක් වූ අතර, සත්‍ය වියදම රු.133,435,067ක් වීමෙන් ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.7,435,067 ක් හෙවත් සියයට 6 ක වැය දරා තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. | වැය විෂය තුලින් අනිවාර්ය ඉතිරි කිරීමක් සිදු කරන බවට භාණ්ඩාගාරය වෙත දැනුම් දී නොමැත. |
| (ඇ) වනජීවි අංශයේ වැය විෂයයන් 05 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් වියදම් අඩු කළ පසු ඉතිරිය රු.323,465,750 ක් වූ අතර එය සියයට 51ක සිට සියයට 100ක් අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. | වනජීවි අංශය වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයාමේදී එම අමාත්‍යාංශය මඟින් ගොඩනැගිලි කුලී ගෙවීම, වෙනත් අමාත්‍යාංශයක අතිරික්ත කාර්යාල උපකරණ භාවිතයට ගැනීම, ප්‍රාග්ධන වියදම්වල වියදම් සීමා කිරීම සහ CITES සමුළුව ලංකාවේ නොපැවැත්වීමට තීරණය වීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/209 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදයේ උපදෙස්වලට අනුකූල නොවී වැය විෂයයන් 07 ක රු.103,073 ක් වූ ඉතිරි කිරීම් රු.528,650 කින් ඉක්මවා බැඳීම්වලට එලඹ තිබුණි. | මුදල් රෙගුලාසිප්‍රකාරව කටයුතු කල යුතු බව | පෙර වර්ෂයේ නොපියවූ අදාල බිල්පත ඊළඟ වර්ෂයේදී පියවිය යුතු වගකීමක් වේ. තවද මුදල් රෙගුලාසි 94 (2) යටතේ වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හා සැපයුම් සඳහා මේ ආකාරයේ බැඳීම් ඇති කර ගැනීම ඉඩ ප්‍රස්ථා සලසා ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **සැලැසුම් කිරීම හා ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | CITES ගිවිසුම ප්‍රකාරව ජිනීවාහි පිහිටි CITES මහලේකම් කාර්යාලයෙන් අයවිය යුතු ඇ.ඩො. 517,235 ක මුදලක් විගණිත දිනතෙක් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අදාළ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. | සත්කාරක ගිවිසුමට අනුව ගෙවන ලද මුදලින්, මූලික වියදම අඩු කර ඉතිරි මුදල ලබා දීමට එකඟ වී ඇති අතර එම මුදල ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. |
| (ආ) | පිරිවැය රු.මිලියන 87.9 ක් වූ වායුසමීකරණය සහ Marquee කුලියට ගැනීම සඳහා 2019 අප්‍රේල් මාසයේ සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර 2019 ජූලි මාසයේදී ඉන් රු. මිලියන 20 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ලෙස හෙළිදරව් කර තිබුණේ රු.මිලියන 25.06 ක් පමණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) 2016 වර්ෂයේ සිට සිදුවූ සැලසුම් කිරීමේ අඩුපාඩු නිසා 2019 පෙබරවාරි මාසයේදී ඇණවුම භාරදී, කඩිනමින් මේස නිම කිරීමට සිදුවීමෙන් රු.26,451,150 ක පිරිවැයකට නිම කළ හැකිව තිබූ කාර්යය සඳහා රු.36,695,350 ක වියදමක් දරා නිමකර තිබුණි. ඒ අනුව අතිරේක අතිකාල ලෙස රු.10,244,200ක් ගෙවීමට සිදු වී තිබුණි. | දරනු ලැබූ අතිරේක වියදම සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. | සයිටීස් සමුළුවේ කඩිනමින් අවසන් කළ යුතු විශාල කාර්යභාරයක් පැවතීම සහ කෙටි කාලයක් තුළ එම අවශ්‍යතාවය සපුරා ගැනීමට සිදුවීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලාව සාමාන්‍ය වැඩ කරන කාලසීමාවේදී අදාළ කාර්යය නිම කළ නොහැකි බැවින් ඒ සඳහා අතිකාල සේවය ලබාගත යුතු බව දන්වා තිබූ නිසා ඒ අනුව කටයුතු කිරීමට සිදු විය. |

| | | |
|---|---|---|
| (ii) තාවකාලික ගොඩනැගිල්ලේ ආවරණය සවි කිරීම හා ගලවා ඉවත් කිරීම සඳහා අන්තර්ජාතික මිල කැඳවීමේදී එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 හා 3.1 වගන්ති වලින් බැහැරවී තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පිළිගනිමි. මෙම විෂයය මෙම අමාත්‍යාංශයට පැවරෙන විට සමුළුව සඳහා ඉතා කෙටි කාලයක් පැවතිම, ජාතික තරඟකාරී ලංසු ලේඛන ඉතා කෙටි කාලයකින් වැඩි දියුණුකර ජාත්‍යන්තර තරඟකාරී ලංසු ලේඛන බවට පරිවර්තනය කිරීමට සිදු වීම. මෙම ප්‍රසම්පාදනය හැර වෙනත් සංකීර්ණ ප්‍රසම්පාදනයන් ගණනාවක කටයුතු සමගාමීව සිදුකිරීමට වීම යන හේතු නිසා ඉතිරිව තිබූ කෙටි කාලය තුළ ප්‍රශස්ත අයුරින් කටයුතු කර ඇත. |

## 3.2 කළමනාකරණ දූර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමුළුවෙන් අනතුරුව පිරිවැයෙන් සියයට 50ක් ගෙවීම් කර බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව විසින් මේස භාරගැනීමට එකඟත්වය පලකර තිබුණි. එසේ වුවද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ආයතන සමඟ කිසිදු ගිවිසුමකට එළඹ නොතිබූ බැවින් මේස මිලදී ගැනීම ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | විධිමත් ගිවිසුමක් සහිතව බාහිර පාර්ශව සමඟ එකඟතාවලට පැමිණිය යුතු වීම. | සමුළුව මෙරට නොපැවැත්වීමට තීරණය කිරීම හේතුවෙන් අපේක්ෂිත ආදායම බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට නොලැබීම නිසා මුදල් නොමැතිකමින් ගෙවීම් කළ නොහැකි බව දැන්වීම නිසා මෙම ගනුදෙනුව සිදු නොවුණි. |
| (ආ) ත්‍රිවිධ හමුදාව යොදාගෙන තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීම වෙනුවෙන් රු.105,700,000 ක මුදලක් වැය කර තිබුණ ද මිලදී ගෙන තිබූ භාණ්ඩ භෞතිකව පරීක්ෂා කර නොතිබුණු අතර ඒවාට අදාල ඉන්වෙන්ට්‍රි සහතික පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල ලිපිලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු බව. | සමුළුවේ විවිධ කටයුතු අමාත්‍ය මණ්ඩලය පත් කළ අනු කමිටු තීරණ මත යුධ, නාවික හා ගුවන් හමුදාවට භාරදුන් අතර එම ආයතනවල තොග ලේඛනවල ඇතුළත් කර ඇත. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු සහ රජයේ ගිණුමට අදාළව වගකීම් පැවරී ඇති නිලධාරීන් ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබීම් කර නොතිබුණි | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අදාල නිලධාරින් ඇප තැබිය යුතු බව. | ඇප තැබීමේ කටයුතු මෙතෙක් අවසන් කොට නොමැති අතර මේ වන විට රාජ්‍ය සේවා අනෝන්‍ය ඇපකාර සංගමය හරහා අදාල ඇප තැබීමේ ක්‍රියාපටිපාටිය ආරම්භ කර ඇත. |